උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ

16

මගේ ජීවිතේ මං ලියපු දීර්ඝම ලිපියේ නිමාවට මං ඇවිත් ඉන්නවා. මට දැනෙන්නෙ වෙනදා නොදැනුනු සහනයක්. දුලිනි පිළිබඳ ආදරයක් හදවතට දැනුනෙ මොන ආකාරයටද ඒ ආදරය මගේ ජීවිතය පුරා මට ඇති කරපු බලපෑම සහ

# ඉඳුවර අංකල් මනික් එක්ක හෙට එයි අපේ ගෙදරට.

මගේ  ආකල්ප කෙරෙහි මා වටා සිටි ගැහැණු චරිත විශේෂයෙන්ම අම්මා ආර්තී සහ තනුරා අක්කා කළ බලපෑම යනාදී සියල්ල වරින් වර අපිළිවෙළට මගේ මතකයට නැගෙන පිළිවෙළට මං ගොනුකරපු මගේ හෙළිදරව්ව ක්‍රමයෙන් අවසානයකට ළඟාවෙලා. මේ ලියුම ලිවීම ආරම්භ කරපු මොහොතෙ මා තුල පැහැදිලි අතට අසුවන අරමුණක් නොතිබුණත් ලියුම අවසානයේ මගේ අභ්‍යන්තර හිත බලාපොරොත්තු වුණු කාරණය ඉටුවෙලා කියලා මටම දැනෙනවා.
මගේ මෙල්බර්න් සංචාරය නිමාවෙන්න තව ඉතිරිවෙලා තියෙන්නෙ සති තුනක් වැනි සීමිත කාලයක් වුණත් මං ගැන තීරණයක් අරන් එය ප්‍රකාශ කරන්න දුලිනිට සති තුනක් ප්‍රමාණවත් වෙයිද කියන ගැටළුව මා තුලම පීඩනයක් ඇති කරනවා. සසංක ඇය වෙනුවෙන් ලියූ අවසන් සහ එකම කවිය මේ වන විට පියානෝව මත මා තැබූ



උපේක්ෂා සේනානායක ලියයි



අතුල උපසිරි කල්දේමුල්ල ගේ සිතුවමින්

පොත තුල තිබී ඇය කියවා අවසන් කර ඇති නම් ඒ කවිය දුලිනි තුල මොන තරං චකිතයක් සහ කම්පනයක් ඇති කර ඇත්දැයි මට අනුමාන කරන්න පුළුවන්. දුලිනි නැවත මොන ගැහෙන දිනය මනහාරි පුහුණුව අවසන් වී පැමිණි පසු තීරණය වන්නට ඉඩ ඇති බැවින් සාරංග සහ මා පෙර සූදානම් කරගත් අපේ වැඩ කටයුතු දියත් කළ යුතු බව මං තීරණය කළා.

මගේ ජීවිතේ ඉදිරිය පිළිබඳව කොළ පාට එළියක් දකිනනට පෙරුම් පුරමින් මං මගේ ලියවිල්ල පරිගනකයේ ගබඩා කර එය ඇමුණුමක් ලෙස සකසා දුලිනිට විද්‍යුත් ලිපියක් යැව්වා. විශ්ව විද්‍යාල සමයේ මා දුටු ඒ අහිංසක හැදිච්ච තරුණිය දැන් මැදිවිය පසු කරමින් සිටින අත්දැකීම් බහුල කාන්තාවක් බැවින් ඇය මා කෙරෙහි දක්වන ප්‍රතිචාරය කවරක් විය හැකිද යන කුතුහලය මගේ හිත තුල කුණාටුවක් මෙන් සැරිසරන බවත් එය අපමණ පීඩාවක් බවත් මා කෙසේ නම් විස්තර කරන්නද?

ඉඳුවර බණ්ඩාරනායක විසින් ලියන ලද දීර්ඝ ලිපිය මෙතැනින් නිමාවේ. මෙතැන් සිට නැවතත් ආරම්භ වන්නේ දුලිනිගේ ආත්ම ප්‍රකාශනයයි.

ඉඳුවර විසින් අමුණා එවන ලද බර ඇමුණුම පරිගනක තිරය මත දිගහැරගෙන බොහෝ වේලාවක් එදෙස බලාසිටි නිසා මගේ දෑස් රිදුම් දෙන්නට විය. දෙකොපුල් තෙමාගෙන කඳුළු ගලා යන විට තවදුරටත් ඒ කඳුළු දෑසේ වේදනාව වෙනුවෙන් වැටෙන කඳුළු නොව නාස්ති වී ගිය මගේ තරුණ අතීතය වෙනුවෙනු නැගෙන කඳුළු බව හිරි වැටී තිබූ මගේ ආත්මයට දැනෙන්නට විය. ඉඳුවර විසින් උපකල්පනය කරන ලද තරම් බලපෑමක් සසංකගේ කවිය මා තුල ඇති නොකළේ යැයි කීවොත් යමෙක් පිළිනොගනු ඇත. නමුත් යථාර්තය නම් එයයි. තම වරදකාරී මානසිකත්වය විසින් මඩින ලද පුද්ගලයකු විසින් ලියන ලද කවියක් කෙරෙහි කියවන්නා තුල හටගන්නා අනුකම්පාව හැරුණු කොට අන්‍යමක් මා තුල ඇතිවුණේ නැත. මා විසින් වල දැමූ අතීතය නැවතත් ගොඩගෙන හද පාරවා ගන්නට තරම් වටිනාකමක් දිය යුතු අතීතයක් නොවේ. මම දැන් වර්ථමානය තුල සාමයෙන් ජීවත් වන වෙනස් පුද්ගලයකු බැවින් ඉඳුවර අරභයා පවා වෙනස් මනසකින් බලන්නට මට පුළුවනි.

මගේ යටි හිත ඉඳුවරට පෙම් කළා දැයි මම නොදනිමි. නමුත් අළුත් හැඟීම් ගොන්නක් හිත තුල පිටාර ගලන බව පමණක් මට දැනේ. මට ඔහු කෙරෙහි ප්‍රේමනීය හැඟීමක් ඇති කරගන්නට කිසිදු බාධාවක් ඇත්තේ නැත. මා තුල ස්වභාවයෙන් බවතින කුලෑටි කම සහ අලස බව හැරුණු කොට හැඟීම් මිය ගිය අප්‍රාණික ගැහැණියක් බවට මා පත් වී නැත. මනහාරී නැවත පැමිණි විට ඉඳුවර සමඟ පිටතට ගොස් ඔහු සමග නිදහසේ කතා කළ යුතු යැයි මම කල්පනා කළෙමි.

නැවතත් ගොතමින් සිටි ගෙත්තම අතට ගෙන මම මිටි පුටුව මත හිඳගතිමි. මනහාරී ගේ ආගමනයට පෙර ගෙත්තම නිමා කළ යුතුය. මම මා වඩාත් පෙම් බැඳි ගීතයක් වාදනය වන්නට ඉඩ හැර ගෙත්තම ඇරඹුවෙමි. පසුගිය වසර ගනනාව තුල මා වෙත තිබුණේ ඉතා කෙටි අරමුණු පමණි. මගේ ගෙවත්ත අලංකාරව තබා ගැනීම, මනහාරීට රසවත් ලෙස කෑම ටික සකසා තැබීම සහ ඉඩක් ලද විට ඔස්ට්‍රේලියානු මහද්වීපයේ මා ස්පර්ශ නොකළ බිම් සොයා යෑම වැනි කෙටි අරමුණු විනා දීර්ඝ කාලීන අරමුණු වලින් මා වැන්නියකට පලක් තිබුණේ නැත. නමුත් ජීවිතය පිළිබඳව අළුතින් අරමුණු කඳු ගසන්නට මට දැන් පුළුවණි. ඒ සියල්ල සැලසුම් කරන විට ඉඳුවර මා පසෙකින් සිටින බව දැනෙන විට ගැහැනියක් ලෙස මා සුරක්ෂිත බවත් පරිපූර්ණ බවත් මට දැනේනට පටන් ගනු ඇත.

කුමක්දෝ අපහැදිලි සතුටක් හිත පුරා දෝරෙ ගලන බ වමට දැනේ. එය හිමිවීම පිළිබඳ සතුට විය යුතුය. මම ඉහළ මාලයේ කවුළුවෙන් පිටත බැලුවෙමි. ඩැන්ඩිනොන්ග් රේන්ජර්ස් කඳු වැටිය තද නිල් පැහැයෙන් ඈත දිස්වේ. වෙනදා නොදුටු චමත්කාරයක් කඳු වලල්ල වෙතින් මට පෙනේ. තව නොබෝ දිනකින් කඳු මුදුන් වලට හිම පතනය ඇරඹෙනු ඇත. වික්ටෝරියානු වාසීන් ඒ යුගය එනතුරු බලාසිටින්නේ හිම ක්‍රීඩා සඳහා කඳු මුදුන් තරණය කිරීමටය. ප්‍රථම හිම තරණයේදී මනහාරී අසනීප වූ අන්දම මට සිහිවේ. දරුණු සීතල ඇයට ඔරොත්තු දුන්නේ නැත. කාලයත් සමග ඈ ඊට හුරුවූවාය.මගේ අසල්වැසි පෝලා සීතල නොතකමින් උද්‍යානයේ ගැවසෙනු මට පෙනේ.ඇය සිය පිළිවැස්මේ සාක්කු වලින් වරින් වර විවධ උපකරණ පිටතට ගනිමින් මල් පඳුරු සහ කුඩා පාලෑටි වල ඉති කප්පාදු කරනු මට පෙනේ. තවත් නිවසකින් කලුකුම් මස් පලහන සුවඳ මගේ නැහැය විනිවිද යයි. මේ සියල්ල වසර ගනනක් තිස්සේ මට පුරුදු දේ වුවත් ඒ සියල්ල කෙරෙහි වෙනදා නොදුටු නැවුම් මනසකින් දකින්නට මට සිතෙන්නේ ඇයි?මා තුල මෙතරම් පිබිදීමක් ඇති කළේ ඉඳුවරගේ ආදරයද? ආදරය යන හැඟුමට පුද්ගලයකු තුල කොපමණ වෙනසක් ඇති කළ හැකිද?

මම පහත මාලයට ගොස් මනහාරීට ඇමතුමක් ගත්තෙමි.
"පුංචී" ඇගේ කටහඬේ ආදරය උතුරා යයි.

"කොහොමද පුතේ" මගේ උගුර රිදුම් දෙයි. මට ඇඬුම් එන්නට වෙයි.
"පුංචි, ඉඳඅවර අංකල් මනික් එක්ක හෙට එයි අපේ ගෙදරට. පුංචි ඒ දෙන්නත් එක්ක එනවද මාව එක්කං යන්න එන්න. අපි එහෙම්මම බැලරාට් පෙන්න්න යමු ඉඳුවර අංකල්ට."
මනහාරී ගිරව්යක මෙන් කියවාගෙන යයි.
"හොඳයි පුතේ, ඔයාට මොනවද කන්න හදන් එන්න ඕනෙ"

"අපි හැමෝටම කන්න සැන්ඩ්විච්ටිකක් එක්ක ෆිෂ් කට්ලට් ටිකක් හදාගෙන එනවද?"
මම උණුසුම් කබායක් ඇඳගෙන වාහනයේ යතුර අතට ගත්තෙමි. කඩයට ගොස් මාළු සමඟ ධාන්‍ය මුසු කළ පාන් රැගෙන ආ යුතුය. මේ රාත්‍රිය දීර්ඝ සහ කාර්යයන් බහුල රාත්‍රියක් වනු ඇත.

**මතු සම්බන්ධයි**

